රග්බි
ලෝක කුසලාන
ජපානය 2019

# ලෝක කුසලාන තරගාවලියේ උණුසුම් සිදුවීම්

ජාත්‍යන්තර රග්බි මණ්ඩලය විසින් 1985 වසරේදී පැවැත්වූ විවාදාත්මක ඡන්දයකින් පසු ලෝක කුසලාන රග්බි තරගාවලිය ආරම්භ විය. වසර 35කට පමණ පසුව, එය ලොව විශ්මය ජනක මෙන්ම මහත් උද්වේගකර තරගාවලියක් දක්වා වර්ධනය වී තිබේ.






## 1987 කර්වාන් නවසීලන්තයට ජීවය දෙයි (නවසීලන්තය 70 යි - ඉතාලිය 06)

සමාරම්භක තරගයේදී ජෝන් කර්වන් විසින් මීටර 70ක් පමණ තනිවම දිවයමින් උත්සාහක දිනුමක් තැබීය. තරගාවලියේ සත්කාරකයන් වූ නවසීලන්තය, ඕක්ලන්ඩ් නුවරදී පැවැති අවසන් මහ තරගයේදී ප්‍රංශය පරාජයට පත්කරමින් ලෝක කුසලාන දිනා ගත්තේය.

## 1991 වේල්සය යටත්වෙයි. (බටහිර සැමෝවා 16 යි - වේල්සය13 යි)

රග්බි ලෝක කුසලාන තරගාවලියේ විශාලතම පෙරළිය සිදුවිය. ප්‍රබල කණ්ඩායමක් වූ වේල්සය පරදවා බටහිර සැමෝවා පිල ජයගත්තේය. පැසිෆික් දූපත්වාසීන්ගේ කායික හා මලලක්‍රීඩා නිපුණතාව සමග වේල්සයට තරග කළ නොහැකි විය.

## 1995 ලෝමු නම්වූ පුරාවෘත්තය (නවසීලන්තය 45 - එංගලන්තය 29)

ලෝක කුසලාන තරගාවලියේ සිය මංගල තරගයට පැමිණි 20 හැවිරිදි ජෝනා ලොමු එංගලන්තයට එරෙහිව පැවැති අවසන් පූර්ව තරගයේදී තියුණු කකුල්මාට්ටු තිබියදීත් උත්සාහක දිනුම් 4ක් ලබාගනිමින් සිය දක්ෂතාව සහ බලපරාක්‍රමය පෙන්වීය.



## 1995 දකුණු අප්‍රිකානුවෝ එක්වෙති (දකුණු අප්‍රිකාව 15 - නවසීලන්තය 12)

ලෝක ක්‍රීඩා ඉතිහාසයේ මෙන්ම පශ්චාත් වර්ණභේදවාදී යුගයේත් සුවිශේෂී සන්ධිස්ථානයකි. දකුණු අප්‍රිකානු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා මහතා 'ස්ප්‍රිංබොක්ස්' (මුව විශේෂයකි) යනුවෙන් හැඳින්වෙන දකුණු අප්‍රිකානු රග්බි කණ්ඩායමේ නිල බැනියමක් පැළඳ ජයග්‍රාහී රග්බි කණ්ඩායම් නායක ෆ්‍රැන්කොයිස් පීනාර් වෙත කුසලාන ප්‍රදානය කළේය.

## 1999 ප්‍රංශ විප්ලවය (ප්‍රංශය 43 - නවසීලන්තය 31)

ලකුණු 24-10 ක් ලෙසින් පසුපසින් සිටි නමුත් ක්‍රිස්ටෝපර් ලැමෙයිසන්ගේ විශිෂ්ට පා ක්‍රියාකාරීතවයෙන් නවසීලන්තය පරාජය කරමින් ප්‍රංශය අවසන් මහ තරගයට පැමිණියේ ටිවීකන්හැම්හි සිටි ප්‍රංශ ක්‍රීඩාලෝලීන් වසඟයට පත්කරමිනි.

## 2003 වොලබීස්ලාගේ විශිෂ්ටත්වය (ඕස්ට්‍රේලියාව 142 - නැමීබියාව 0)

තරගයේ ආධිපත්‍යය පැතිරූ ඕස්ට්‍රේලියාව මිනිත්තු 2කට පසුව උත්සාහක දිනුම් 22 ක් තැබීය. මෙය ලෝක කුසලාන තරගාවලියේ වාර්තාගත ජයග්‍රහණයකි.

## 2003 තනි පා පහරේ කීර්තිය (එංගලන්තය 20 - ඕස්ට්‍රේලියාව 17)

ලෝක කුසලාන රග්බි තරගාවලිය ජයගත් උතුරු අර්ධ ගෝලයේ පළමු කණ්ඩායම එංගලන්තයයි. තරගයේ අතිරේක කාලයෙන් තත්පර 26 ක් ඉතුරුව තිබියදී එංගලන්තයේ ජොනී විල්කින්සන් (වමේ) ඩ්‍රොප් ගෝලයකින් තරගය ජයගත්තේය.

## 2007 පූමාස්ලාගේ ආගමනය (ආර්ජන්ටිනාව 17 - ප්‍රංශය 12)

නව රග්බි බලවේගයක් ලෙසින් පැමිණි ආර්ජන්ටිනාව ප්‍රබල ප්‍රංශය, අයර්ලන්තය සහ ස්කොට්ලන්තය පරාජයට පත්කරමින් තෙවැනි ස්ථානය හිමිකර ගත්තේය.




## 2011 කළු කමිසකාරයන්ගේ ජයග්‍රහණය (නවසීලන්තය 8 - ප්‍රංශය 7)

නවසීලන්තයේ ඕක්ලන්ඩ් නුවර පිහිටි ඊඩ්න් උද්‍යාන ක්‍රීඩාංගණයේදී පැවැති තරගයේදී රිචී මැකෝ (දකුණේ) නායකත්වය දුන් නවසීලන්තය වසර 24කට පසු දෙවැනි වර රග්බි ලෝක කුසලාන දිනාගැනීමට සමත්විය.

## 2015 ජපනා හපනා (ජපානය 34 - දකුණු අප්‍රිකාව 32)

දෙවරක් රග්බි ලෝක ශූරයින් වූ දකුණු අප්‍රිකාව පරාජයට පත්කිරීමට මයිකල් ලීච් නායකත්වය දුන් ජපානය සමත්විය. 1991 දී ලෝක කුසලාන තරගාවලියට එක්වූ ජපානය පළමු ලෝක කුසලාන තරගය ජයගත්තේය.

## 2019 අලුත් ඉසව්වක්

ජපානය සාම්ප්‍රදායික තරග රටාවෙන් මිදී ප්‍රථම වරට රග්බි ලෝක කුසලාන තරගාවලියක සත්කාරකත්වය දරයි. රග්බි ලෝක කුසලාන තරගාවලිය සුපුරුදු ඉසව්වලින් ඈතට ගමන් කරයි

ග්‍රැෆින් නිව්ස් ඇසුරිනි : සිංහල සැකසුම - සංජය එරමුදුගොඩ